මගේ අංකය
எனது இல.
My No. Article 12 (1)

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2018/01/22

(2)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

පැමිණිලිකාරිය : පී.පී.එන්.ඩී පෙරේරා මිය.
කෘෂිකර්ම උපදේශක.
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන් පළාත්) කාර්යාලය.
අම්පාර.

වගඋත්තරකරුවන් : කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
පේරාදෙණිය.

පැමිණිලි අංකය : **HRC/K/75/17**

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභා වෙත පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර ඇත්තේ. තමා 2016 හා 2017 වර්ෂවලදී ස්ථානමාරුවීම් ඉල්ලීම් සිදුකරන ලද බවත් තමාගේ ස්ථාන මාරුව 2016 දී කිසිදු හේතුවක් නොදක්වා අවලංගු කරන ලද බවත් ඒ අවස්ථාවේදී තමා ස්ථාන මාරුවීම් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර නොමැති බව හේතු වශයෙන් වගඋත්තර නිලධාරීන් දන්වා ඇති බවත්ය. ඉන්පසු තමා නැවතත් 2017 වර්ෂයේදී ස්ථාන මාරු ඉල්ලුම් කරන ලද බවත් ඒ අනුව ස්ථාන මාරු මණ්ඩලයේ 2016.10.24 දින ලිපියෙන් තම ස්ථාන මාරුව යෝජනා වී ඇති බවත් නමුත් 2016.12.29 දින පවත්වන ලද අභියාචනා මණ්ඩලයේදී එකී ස්ථාන මාරුව ඉවත් කර ඇති බවත් තමා මෙම අභියාචනා මණ්ඩලයට කිසිදු අභියාචනයක් යොමුකර නොතිබූ අවස්ථාවක එසේ තම නම ඉවත් කර ඇති බවත් දක්වා ඇත.

පසුව තමාට දැනගන්නට ලැබුණු පරිදි තමා ඉල්ලුම් කරනු ලැබූ ස්ථාන මාරුව. බිබිල පළතුරු පර්යේෂණ ආයතනයේ සේවක පිරිසක් විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත හා බිබිල පළතුරු පර්යේෂණ ආයතනයේ ප්‍රධාන ආයතන වෙත යොමුකර ඇති පෙත්සමක් හේතුකොටගෙන. ඉවත් කර ඇති බවත් ඒ අනුව තමාගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත් සඳහන් කර ඇත. ස්ථාන

නො 14, ආර්.ඒ.ද මැල් මාවත, කොළඹ 04.
இல. 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை கொழும்பு - 04
0112 505580 - 82

ප්‍රධාන කාර්යාලය :- අංක 165, කින්සි පාර, කොළඹ - 08.
தலைமைக் காரியாலயம் :- இல 165, கின்சி வீதி, கொழும்பு - 08.
*Head Office* :- No 165, Kynsey Road, Colombo - 08.

*Tele* : +94 -11- 2694925, 2685980, 2685981
*Chairman* : 2696470
*Secretary* : 2689558
*Hotline* : 2689064

*Fax* : +94 11 2694924
*E-Mail* : sechrc@sltnet.lk
*Web* : www.hrcsl.lk

මාරු මණ්ඩලයෙන් අනුමත වූ තමාගේ ස්ථාන මාරුව. නැවත ලබා දෙන ලෙස අදාළ වගඋත්තරකරුවන්ට නියෝග කරන ලෙසත් වගඋත්තර පාර්ශවයෙන් ලක්ෂ 10 ක වන්දි මුදලක් ලබාදෙන ලෙසත් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටී.

වගඋත්තර පාර්ශවීය සැළකිරීම් :-

මෙකී පැමිණිල්ල සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ සඳහන්ව ඇත්තේ මෙම පැමිණිලිකාරිය 2017 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අපේක්ෂිත සේවා ස්ථාන වශයෙන් පළතුරු පර්යේෂණ ආයතනය මදුරුකැටිය හා දොඩම් පර්යේෂණ ඒකකය. බිබිල යන ස්ථාන අයදුම් කර තිබූ බවත්.

තවද මෙම අය 2017 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ මොණරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය වෙත ඉල්ලීම් කර නොමැති වුවද ඊට පෙර 2005.12.01 දින සිට 2010.05.02 දින දක්වා මොණරාගල නියෝජ්‍ය කෘෂිකර්ම (අන්තර් පළාත්) කාර්යලෙයේ සේවය කර ඇති බවත් එහි සේවය කරන කාලය තුළ මෙම නිලධාරිනියගේ ක්‍රියාකලාපය යහපත් නොවන බවට වාර්තා වී ඇති බවත් එහෙයින් එම සේවා ස්ථානය සඳහා ඇයව ස්ථාන මාරුකිරීමේ හැකියාවක් නොමැති බවත් දක්වා ඇත.

ඇයට එරෙහිව යොමු කර ඇති පෙත්සමේ ඇති අත්සන් සම්බන්ධයෙන් සත්‍ය අසත්‍යතාවය පිළිබඳ බිබිල දොඩම් පර්යේෂණ ඒකකයෙන් විමසන ලද අතර එම පෙත්සමෙහි අත්සන් කර ඇති සේවකයින් එකී සේවා ස්ථානයේ සේවය කරන බවත් ඔවුන්ගේ අත්සන් නිවැරදි බවත් අදාළ ඒකකයේ ස්ථාන භාර නිලධාරීන් විසින් සනාථ කර ඇති බවත්. එකී සියළු කරුණු සොයා බැලීමෙන් පසුව මෙම නිලධාරිනිය බිබිල දොඩම් පර්යේෂණ ඒකකය වෙත කර තිබූ ස්ථාන මාරුව අවලංගු කර අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය වෙත ස්ථාන මාරුවීම සිදුකර ඇති බවත් දක්වා ඇත.

මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකාරිය කෘෂිකර්ම උපදේශකවරියක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නෝරුව උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ සේවය කරන අතර 2016 හා 2017 වර්ෂ දෙකෙහිම මොණරාගල දිස්ත්‍රික්කයට ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති බවත්. 2016 වර්ෂයේදී මොණරාගල දිස්ත්‍රික්කයට ඉල්ලන ලද ස්ථාන මාරුව පිළිබඳ සලකා බලා අදාළ ස්ථාන මාරුව ලබා දී තිබියදී කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් කිසිදු හේතු දැක්වීමකින් තොරව අදාළ ස්ථාන මාරුව අවලංගු කර ඇති බවත් අනාවරණය වී ඇත.

උදාළ ස්ථාන මාරුව අවලංගු කිරීමට එරෙහිව පැමිණිලිකාරිය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අංක HRC/541/15 දරණ පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවීය කෘෂිකර්ම

අධ්‍යක්ෂජනරාල්වරයා විසින් දන්වා ඇත්තේ. පැමිණිලිකාරියට ස්ථාන මාරුවීම ලබා දී ඇති බිබිල පළතුරු පර්යේෂණ ආයතනයේ සේවකයින් විසින් පැමිණිලිකාරිය අදාළ ස්ථානයට පැමිණිය හොත් ගැටළු ඇතිවිය හැකි බවට ඉදිරිපත් කර ඇති පෙත්සමක් හේතුවෙන් ස්ථාන මාරුව අවලංගු කර ඇති බවයි.

2017 වර්ෂයේදීද පැමිණිලිකාරිය විසින් මොණරාගල ප්‍රදේශයට ස්ථාන මාරුවක් ඉල්ලා වාර්ෂික ස්ථාන මාරු යටතේ අයදුම් කිරීමෙන් පසු බිබිල දොඩම් පර්යේෂණ ආයතනය වෙත ස්ථාන මාරුව ලබා දීමට අනුමතර කර තිබියදී නැවත වරක් අදාළ ආයතනයේ සේවකයින්ගේ විරෝධතා පෙත්සමක් හේතුවෙන් අදාළ ස්ථාන මාරුව ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති බවද අදාළ ස්ථාන මාරුව අවලංගු කර පැමිණිලිකාරිය ස්ථාන මාරුවක් ඉල්ලා නොමැති අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යාපන (අන්තර් පළාත්) කාර්යාලය වෙත ස්ථාන මාරුවක් ලබා දී ඇති බවද අනාවරණය වී ඇත.

උක්ත පැමිණිල්ලට අදාළව කොමිසම මඟින් සිදුකරන ලද පරීක්ෂණ කටයුතුවලදී වගඋත්තර පාර්ශවය වෙත පැමිණිලිකාරියගේ ස්ථාන මාරුවීමට එරෙහිව බිබිල දොඩම් පර්යේෂණ ඒකකයේ සේවකයින් විසින් ඉදිරිපත් කර ඇති පේතසමේ සඳහන් අත්සන් පිළිබඳ පරීක්ෂණයක් සිදුකරන ලෙස දැන්වූවද ඒ සඳහා නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව තහවුරු වේ.

ස්ථාන මාරුවීම් ලබා පැමිණෙන නිලධාරියකු හේතුවෙන් අදාළ ආයතනයේ පරිපාලනයට බාධා ඇතිවිය හැකි බවට එහි සේවකයින් හා නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් හේතුවෙන් අදාළ ස්ථාන මාරුවීම අවලංගු කිරීම පරිපාලන දුර්වලතාවයක් වන අතර ස්ථාන මාරුවීම් ලබා පැමිණෙන නිලධාරියා රාජකාරී කිරීමේදී යම් ගැටළුවක් ඇති වන්නේ නම් එහිදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම නිසි ක්‍රමවේදය වේ.

තවද සේවා ස්ථානයක ආයතන ප්‍රධානියා විසින් නිලධාරියෙකුට විරෝධය පළකර අත්සන් තබන ලෙස ලිපියක් ලබාදුන්විට එයට එරෙහි වීමට බොහෝ දුරට සේවකයින්ට නොහැකි බැවින් එයට අත්සන් කිරීමට සිදුවේ. ඒ අනුව එම කරුණු මත තීරණ ගැනීම මඟින් අදාළ නිලධාරියාට අගතියක් සිදුවේ.

පැමිණිලිකාරිය අදාළ ස්ථානය සඳහා අවස්ථා 2කදී ස්ථාන මාරු ලබා දීමේදී මෙවැනි පෙත්සම් ඉදිරිපත් කිරීම මඟින් පෙනී යන්නේ පැමිණිලිකාරිය අදාළ සේවා ස්ථානයට පැමිණීම වැළැක්වීම සඳහා යම් පාර්ශවයක් විසින් සැලසුම් සහගතව සිදුකරනු ලබන ක්‍රියාමාර්ගයක් බවයි.

පැමිණිලිකාරියට ලබා දීමට අනුමත කර තිබූ ස්ථාන මාරුව අවලංගු කර පැමිණිලිකාරිය ඉල්ලුම් නොකරන ලද වෙනත් ස්ථානයකට ස්ථාන මාරුවක් ලබා දීමට ක්‍රියා කිරීම මඟින් පෙනී යන්නේ පැමිණිලිකාරියට එරෙහිව ද්වේශ සහගත ලෙස කටයුතු කර අදාළ ස්ථාන මාරුව ලබා දී ඇති බවයි.

නිගමනය :-

ඒ අනුව පැමිණිලිකාරිය 2016 හා 2017 යන වර්ෂ දෙකෙහිම ඉල්ලා තිබූ ස්ථාන මාරු ලබා දී නැවත කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව අවලංගු කර. නොඉල්ලන ලද ස්ථානයකට හේතු නොදක්වා ස්ථාන මාරු කිරීම තුළින් පැමිණිලිකාරියට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කර දී ඇති සමාන ලෙස සැළකිලි ලැබීමට ඇති මූලික අයිතිවාසිකම වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. පැමිණිලිකාරිය ඉල්ලා ඇති ස්ථාන මාරුව අදාළ ස්ථානයටම වහාම ලබා දීමට පියවර ගත යුතුය.

2. පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම වෙනුවෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් අමාත්‍යංශ ලේකම්වරයා වෙතද යොමුකරනු ලැබේ.

2018.02 .22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- අමාත්‍යංශ ලේකම්.
කෘෂිකර්ම අමාත්‍යංශය.

B/